

# ශ්‍රී ලංකා ජාතික ආර්ථික සභාව

## වහාම බඳවා ගැනීමේ පුරප්පාඩු

ශ්‍රී ලංකා ජාතික ආර්ථික සභාව (NEC, www.necsl.gov.lk) යනු ශ්‍රී ලංකා රජයේ ආර්ථික, සාමාජීය සංවර්ධන සැලසුම් සහ ප්‍රමුඛතාවලට අනුකූලව ආර්ථික ප්‍රතිපත්ති සකස් කිරීම, සම්බන්ධීකරණය, සමාලෝචනය සහ ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම පිළිබඳ වගකිව යුතු රජයේ ඉහළම ආයතනය යි. එහි සභාපතිත්වය අතිගරු ජනාධිපතිතුමා විසින් දරණ අතර එහි මහ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් ජාතික ආර්ථික සභාවේ කටයුතු මෙහෙයවීම සිදු කෙරේ.

ආර්ථික කටයුතු පිළිබඳව අමාත්‍ය මණ්ඩලයට වගකියන සහ අමාත්‍යාංශ හා රජයේ ප්‍රධානතම ආර්ථික ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක වන මෙම ජාතික ආයතනය උසස් මට්ටමේ වෘත්තීයවේදීන් විසින් කළමනාකරණය කරනු ලැබේ. ජාතික ආර්ථික සභාව, ආර්ථික කටයුතු, රාජ්‍ය මූල්‍ය කටයුතු හා මූල්‍ය කටයුතු වශයෙන් ආර්ථිකයේ සියලුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ප්‍රධාන අංශ තුනකින් සමන්විත වේ. 2017 අගෝස්තු මාසයේ දී ස්ථාපිත කරනු ලැබූ මෙම ආයතනයේ මූලස්ථානය කොළඹ ලෝක වෙළඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ නොබෝ දිනකින් පිහිටවනු ඇත.

**ආර්ථික හා සාමාජීය සංවර්ධනය සහ ජාතික සෞභාග්‍යයයේ උන්නතිය උදෙසා මෙම සුවිශේෂී, ඉහළ තලයේ ජාතික ආයතනයේ ප්‍රධාන කණ්ඩායමේ කොටස්කරුවන් වන ලෙස ඉහළ සුදුසුකම් සහිත, පළපුරුදු හා උද්යෝගිමත් වෘත්තීයවේදීන් වෙත මෙයින් අප ආරාධනා කරමු.**

### නියෝජ්‍ය මහ ලේකම් තනතුර

| තනතුර | නියෝජ්‍ය මහ ලේකම් (ආර්ථික කටයුතු) | නියෝජ්‍ය මහ ලේකම් (රාජ්‍ය මූල්‍ය කටයුතු) | නියෝජ්‍ය මහ ලේකම් (මූල්‍ය කටයුතු) |
|---|---|---|---|
| විෂයපථය හා වගකීම් | ජාතික ආර්ථික සැළසුම්, ඍජු විදේශ ආයෝජන, ජාත්‍යන්තර වෙළඳාම, සංචාරක කර්මාන්තය, කාර්මික හා කෘෂිකාර්මික සංවර්ධනය, සමාජයීය වැඩසටහන් සහ තිරසාර සංවර්ධනය ඇතුලු ආර්ථික හා සාමාජයීය ප්‍රතිපත්ති සකස් කිරීම, සමාලෝචනය හා අධීක්ෂණයට නායකත්වය ලබාදීම සහ එම කටයුතු කළමනාකරණය කරමින් මහ ලේකම්වරයා වෙත වාර්තා කිරීම. | රාජ්‍ය ආදායම්, බදුකරණය, රාජ්‍ය වියදම්, ජාතික අයවැය, විදේශ සම්පත්, ණය ගැනීම් හා රාජ්‍ය ණය ඇතුළුව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම, සමාලෝචනය හා අධීක්ෂණයට නායකත්වය ලබාදීම සහ එම කටයුතු කළමනාකරණය කරමින් මහ ලේකම්වරයා වෙත වාර්තා කිරීම. | බැංකු හා මූල්‍ය ආයතන, විශ්‍රාම අරමුදල් සහ මුදල්, බැඳුම්කර, කොටස් හා භාණ්ඩ වෙළෙඳපොළ ඇතුළු ප්‍රාග්ධන වෙළඳපොළ යන අංශ ඇතුළත් මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සකස් කිරීම, සමාලෝචනය හා අධීක්ෂණයට නායකත්වය ලබාදීම සහ එම කටයුතු කළමනාකරණය කරමින් මහ ලේකම්වරයා වෙත වාර්තා කිරීම. |
| අධ්‍යාපන සුදුසුකම් | පිළිගත් විශ්වවිද්‍යාලයක මූලික උපාධිය සමඟ ආර්ථික විද්‍යාව හෝ මූල්‍ය පිළිබඳ විශේෂීකරණය වූ විද්‍යාපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම අත්‍යවශ්‍ය වේ. අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් ලබා තිබීම වඩාත් සුදුසු වේ. මීට අමතරව අදාළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම අමතර සුදුසුකමක් වේ. | | |
| පළපුරුද්ද | රජයේ, බහු පාර්ශික හෝ පෞද්ගලික අංශයේ ආයතනවල ක්‍රමක්‍රමයෙන් වගකිවයුතු තනතුරුවල අවම වශයෙන් වසර 10ක අදාළ පළපුරුද්ද. | | |

### සහකාර මහ ලේකම් තනතුර

| | සහකාර මහ ලේකම් (පරිපාලන) | සහකාර මහ ලේකම් (ජා.අ.ස. මහ ලේකම් කාර්යාලය) |
|---|---|---|
| විෂය පථය හා වගකීම් | මානව සම්පත්, මූල්‍ය, තොරතුරු තාක්ෂණය, සුසංවිධාන (Logistics) සේවා, මාධ්‍ය හා බාහිර සබඳතා සහ ජාතික බුද්ධි මණ්ඩලය පිළිබඳ කටයුතු සඳහා නායකත්වය ලබාදීම සහ එම කටයුතු කළමනාකරණය කරමින් මහ ලේකම්වරයා වෙත වාර්තා කිරීම. | ජාතික ආර්ථික සභාව, අමාත්‍ය මණ්ඩලය, රේඛීය අමාත්‍යාංශ හා ආයතන සහ වෙනත් බාහිර සංවිධාන, රැස්වීම් න්‍යාය පත්‍ර හා සටහන් සැලසුම් කිරීම හා පවත්වාගෙන යාම සහ දෛනික මෙහෙයුම් ඇතුළුව ජාතික ආර්ථික සභාවේ විවිධ අංශ අතර සම්බන්ධීකරණය හා ලිපි ගණුදෙනු කිරීම, ආදී ජා.අ.ස. මහලේකම් කාර්යාලයේ කටයුතුවලට නායකත්වය ලබාදීම සහ එම කටයුතු කළමනාකරණය කරමින් මහ ලේකම්වරයා වෙත වාර්තා කිරීම. |
| සුදුසුකම් | පිළිගත් විශ්වවිද්‍යාලයක මූලික උපාධිය සමඟ ව්‍යාපාර පරිපාලනය, කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය හෝ අදාළ විෂය ක්ෂේත්‍රයක විද්‍යාපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම අත්‍යාවශ්‍ය වේ. මීට අමතරව අදාළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම අමතර සුදුසුකමක් වේ. | |
| පළපුරුද්ද | රජයේ, බහු පාර්ශික හෝ පෞද්ගලික අංශයේ ආයතනවල ක්‍රමක්‍රමයෙන් වගකිවයුතු තනතුරුවල අවම වශයෙන් වසර 10ක අදාළ පළපුරුද්ද. | |

### අධ්‍යක්ෂ තනතුරු

| තනතුර | අධ්‍යක්ෂ (කාර්මික සංවර්ධන) | අධ්‍යක්ෂ (කෘෂිකාර්මික සංවර්ධන) | අධ්‍යක්ෂ (යටිතල පහසුකම් සංවර්ධන) |
|---|---|---|---|
| විෂය පථය හා වගකීම් | ජාතියේ කාර්මික සංවර්ධනය සඳහා වන ජාතික කාර්මික ප්‍රතිපත්ති සහ උපායමාර්ග සකස් කිරීම, සමාලෝචනය හා අධීක්ෂණය කරමින් සහකාර මහ ලේකම් (ආර්ථික කටයුතු) වෙත වාර්තා කිරීම. | ජාතියේ කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා වන ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ උපායමාර්ග සකස් කිරීම, සමාලෝචනය හා අධීක්ෂණය කරමින් සහකාර මහ ලේකම් (ආර්ථික කටයුතු) වෙත වාර්තා කිරීම. | ජාතියේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන ජාතික යටිතල පහසුකම් සංවර්ධන ප්‍රතිපත්ති සහ උපායමාර්ග සකස් කිරීම සමාලෝචනය සහ අධීක්ෂණය කරමින් සහකාර මහ ලේකම් (ආර්ථික කටයුතු) වෙත වාර්තා කිරීම. |
| සුදුසුකම් | පිළිගත් විශ්වවිද්‍යාලයක ප්‍රථම උපාධිය සමඟ කාර්මික ඉංජිනේරු විද්‍යාව, කාර්මික කළමනාකරණය, ආර්ථික විද්‍යාව හෝ අදාළ විෂය ක්ෂේත්‍රයක විද්‍යාපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා සිටීම අත්‍යාවශ්‍ය වේ. අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් ලබා තිබීම වඩාත් සුදුසු වේ. මීට අමතරව අදාළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම අමතර සුදුසුකමක් වේ. | පිළිගත් විශ්වවිද්‍යාලයක ප්‍රථම උපාධිය සමඟ කෘෂිකර්මය, කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව හෝ අදාළ විෂය ක්ෂේත්‍රයක විද්‍යාපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා සිටීම අත්‍යාවශ්‍ය වේ. අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් ලබා තිබීම වඩාත් සුදුසු වේ. මීට අමතරව අදාළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම අමතර සුදුසුකමක් වේ. | පිළිගත් විශ්වවිද්‍යාලයක ප්‍රථම උපාධිය සමඟ ඉංජිනේරු විද්‍යාව, ආර්ථික විද්‍යාව, මූල්‍ය හෝ අදාළ විෂය ක්ෂේත්‍රයක විද්‍යාපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම අත්‍යාවශ්‍ය වේ. අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් ලබා තිබීම වඩාත් සුදුසු වේ. මීට අමතරව අදාළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම අමතර සුදුසුකමක් වේ. |
| පළපුරුද්ද | රජයේ, බහු පාර්ශික හෝ පෞද්ගලික අංශයේ ආයතනවල ක්‍රමක්‍රමයෙන් වගකිවයුතු තනතුරුවල අවම වශයෙන් වසර 10ක අදාළ පළපුරුද්ද. | | |

| තනතුර | අධ්‍යක්ෂ (ඍජු විදේශ ආයෝජන) | අධ්‍යක්ෂ (ජාත්‍යන්තර වෙළෙඳ) | අධ්‍යක්ෂ (සමාජ වැඩසටහන්) |
|---|---|---|---|
| විෂය පථය හා වගකීම් | ඍජු විදේශ ආයෝජන සඳහා ආයෝජකයින් ආකර්ෂණය කරගැනීම පිණිස දිරි ගැන්වීම් රාමුවක් ඇතුළුව ඍජු විදේශ ආයෝජන ප්‍රතිපත්ති හා උපාය මාර්ග සකස් කිරීම, සමාලෝචනය හා අධීක්ෂණය කරමින් නියෝජ්‍ය මහ ලේකම් (ආර්ථික කටයුතු) වෙත වාර්තා කිරීම. | ආනයන හා අපනයන, නිදහස් වෙළෙඳ ගිවිසුම් හා ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ බදු ප්‍රතිපත්ති ඇතුළුව ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්ති හා උපාය මාර්ග සකස් කිරීම සමාලෝචනය හා අධීක්ෂණය කරමින් නියෝජ්‍ය මහ ලේකම් (ආර්ථික කටයුතු) වෙත වාර්තා කිරීම. | අධ්‍යාපනය, සෞඛ්‍ය, විශ්‍රාම ක්‍රම, සමාජ ආරක්ෂාව හා දිළිඳුකම පිටු දැකීම වැනි සමාජ වැඩසටහන් පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම, සමාලෝචනය හා අධීක්ෂණය කරමින් නියෝජ්‍ය මහ ලේකම් (ආර්ථික කටයුතු) වෙත වාර්තා කිරීම. |
| සුදුසුකම් | පිළිගත් විශ්වවිද්‍යාලයක ප්‍රථම උපාධිය සමඟ ජාත්‍යන්තර ආර්ථික විද්‍යාව, ජාත්‍යන්තර මූල්‍ය හෝ අදාළ විෂය ක්ෂේත්‍රයක විද්‍යාපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම අත්‍යාවශ්‍ය වේ. අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් ලබා තිබීම වඩාත් සුදුසු වේ. මීට අමතරව අදාළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම අමතර සුදුසුකමක් වේ. | පිළිගත් විශ්වවිද්‍යාලයක ප්‍රථම උපාධිය සමඟ ජාත්‍යන්තර ආර්ථික විද්‍යාව හෝ අදාළ විෂය ක්ෂේත්‍රයක විද්‍යාපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම අත්‍යාවශ්‍ය වේ. අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් ලබා තිබීම වඩාත් සුදුසු වේ. මීට අමතරව අදාළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම අමතර සුදුසුකමක් වේ. | පිළිගත් විශ්වවිද්‍යාලයක ප්‍රථම උපාධිය සමඟ ආර්ථික විද්‍යාව, රාජ්‍ය මූල්‍ය, සමාජ සංවර්ධනය හෝ අදාළ විෂය ක්ෂේත්‍රයක ශාස්ත්‍රපති හෝ විද්‍යාපති උපාධියක් ලබා තිබීම අත්‍යාවශ්‍ය වේ. අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් ලබා තිබීම වඩාත් සුදුසු වේ. මීට අමතරව අදාළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම අමතර සුදුසුකමක් වේ. |
| පළපුරුද්ද | රජයේ, බහු පාර්ශික හෝ පෞද්ගලික අංශයේ ආයතනවල ක්‍රමක්‍රමයෙන් වගකිවයුතු තනතුරුවල අවම වශයෙන් වසර 10ක අදාළ පළපුරුද්ද. | | |

| තනතුර | අධ්‍යක්ෂ (රාජ්‍ය ආදායම්) | අධ්‍යක්ෂ (රාජ්‍ය වියදම්) | අධ්‍යක්ෂ (රාජ්‍ය ව්‍යවසාය) |
|---|---|---|---|
| විෂය පථය හා වගකීම් | රාජ්‍ය ආදායම් හා බදු ප්‍රතිපත්ති සකස් කිරීම, සමාලෝචනය හා අධීක්ෂණය කරමින් නියෝජ්‍ය මහ ලේකම් (රාජ්‍ය මූල්‍ය) වෙත වාර්තා කිරීම. | රාජ්‍ය වියදම් ප්‍රතිපත්ති සකස් කිරීම, සමාලෝචනය හා අධීක්ෂණය කරමින් නියෝජ්‍ය මහ ලේකම් (රාජ්‍ය මූල්‍ය) වෙත වාර්තා කිරීම. | රාජ්‍ය ව්‍යවසාය කාර්යසාධනය, ප්‍රතිසංස්කරණ හා ප්‍රතිව්‍යුහගත කිරීම ඇතුළුව රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිපත්ති සකස් කිරීම. සමාලෝචනය හා අධීක්ෂණය කරමින් නියෝජ්‍ය මහ ලේකම් (රාජ්‍ය මූල්‍ය) වෙත වාර්තා කිරීම. |
| සුදුසුකම් | පිළිගත් විශ්වවිද්‍යාලයක ප්‍රථම උපාධිය සමඟ රාජ්‍ය මූල්‍ය, ආර්ථික විද්‍යාව හෝ අදාළ විෂය ක්ෂේත්‍රයක විද්‍යාපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම අත්‍යාවශ්‍ය වේ. අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් ලබා තිබීම වඩාත් සුදුසු වේ. මීට අමතරව අදාළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම අමතර සුදුසුකමක් වේ. | පිළිගත් විශ්වවිද්‍යාලයක ප්‍රථම උපාධිය සමඟ රාජ්‍ය මූල්‍ය, ආර්ථික විද්‍යාව හෝ අදාළ විෂය ක්ෂේත්‍රයක විද්‍යාපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම අත්‍යාවශ්‍ය වේ. අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් ලබා තිබීම වඩාත් සුදුසු වේ. මීට අමතරව අදාළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම අමතර සුදුසුකමක් වේ. | පිළිගත් විශ්වවිද්‍යාලයක ප්‍රථම උපාධිය සමඟ රාජ්‍ය මූල්‍ය, මූල්‍ය, ආර්ථික විද්‍යාව හෝ අදාළ විෂය ක්ෂේත්‍රයක විද්‍යාපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම අත්‍යාවශ්‍ය වේ. අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් ලබා තිබීම වඩාත් සුදුසු වේ. මීට අමතරව අදාළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම අමතර සුදුසුකමක් වේ. |
| පළපුරුද්ද | රජයේ, බහු පාර්ශික හෝ පෞද්ගලික අංශයේ ආයතනවල ක්‍රමක්‍රමයෙන් වගකිවයුතු තනතුරුවල අවම වශයෙන් වසර 10ක අදාළ පළපුරුද්ද. | | |

| තනතුර | අධ්‍යක්ෂ (රාජ්‍ය ණය) | අධ්‍යක්ෂ (මූල්‍ය ආයතන) | අධ්‍යක්ෂ (ප්‍රාග්ධන වෙළෙඳපොල) |
|---|---|---|---|
| විෂය පථය හා වගකීම් | විදේශ සම්පත්, ණය ගැනීම් හා රාජ්‍ය ණය නිකුතුව හා කළමනාකරණය ඇතුළුව රාජ්‍ය ණය ප්‍රතිපත්ති සකස්කිරීම, සමාලෝචනය හා අධීක්ෂණය කරමින් නියෝජ්‍ය මහ ලේකම් (රාජ්‍ය මූල්‍ය) වෙත වාර්තා කිරීම. | බැංකු හා මූල්‍ය ආයතන, විශ්‍රාම වැටුප් අරමුදල් සහ මූල්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනයට අදාළ ප්‍රතිපත්ති හා උපායමාර්ග සකස් කිරීම, සමාලෝචනය හා අධීක්ෂණය කරමින් නියෝජ්‍ය මහ ලේකම් (මූල්‍ය කටයුතු) වෙත වාර්තා කිරීම. | මුදල්, බැඳුම්කර, කොටස් හා භාණ්ඩ වෙළඳපල සංවර්ධනය යන ක්ෂේත්‍රවල ප්‍රාග්ධන වෙළඳපල, ප්‍රතිපත්ති හා උපායමාර්ග සකස් කිරීම, සමාලෝචනය හා අධීක්ෂණය කරමින් නියෝජ්‍ය මහ ලේකම් (මූල්‍ය කටයුතු) වෙත වාර්තා කිරීම. |
| සුදුසුකම් | පිළිගත් විශ්වවිද්‍යාලයක ප්‍රථම උපාධිය සමඟ රාජ්‍ය මූල්‍ය, ආර්ථික විද්‍යාව මූල්‍ය හෝ අදාල විෂය ක්ෂේත්‍රයක විද්‍යාපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම අත්‍යාවශ්‍ය වේ. අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් ලබා තිබීම වඩාත් සුදුසු වේ. මීට අමතරව අදාළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම අමතර සුදුසුකමක් වේ. | පිළිගත් විශ්වවිද්‍යාලයක බැංකුකරණය, මූල්‍ය, ආර්ථික විද්‍යාව හෝ අදාල විෂය ක්ෂේත්‍රයක විද්‍යාපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම අත්‍යාවශ්‍ය වේ. අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් ලබා තිබීම වඩාත් සුදුසු වේ. මීට අමතරව අදාළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම අමතර සුදුසුකමක් වේ. | පිළිගත් විශ්වවිද්‍යාලයක ප්‍රථම උපාධිය සමඟ මූල්‍ය, ආර්ථික විද්‍යාව හෝ අදාල විෂය ක්ෂේත්‍රයක විද්‍යාපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම අත්‍යාවශ්‍ය වේ. අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් ලබා තිබීම වඩාත් සුදුසු වේ. මීට අමතරව අදාළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම අමතර සුදුසුකමක් වේ. |
| පළපුරුද්ද | රජයේ, බහු පාර්ශික හෝ පෞද්ගලික අංශයේ ආයතනවල ක්‍රමක්‍රමයෙන් වගකිවයුතු තනතුරුවල අවම වශයෙන් වසර 10ක අදාළ පළපුරුද්ද. | | |

## ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ කළමනාකාර තනතුරු

| තනතුර | ප්‍රධාන මූල්‍ය නිලධාරී | කළමනාකරු (මානව සම්පත්) | කළමනාකරු (තොරතුරු තාක්ෂණ) |
|---|---|---|---|
| විෂය පථය හා වගකීම් | මූල්‍ය සැලසුම්, අයවැය සැකසීම, මුදල් ප්‍රවාහ කළමනාකරණය, ගිණුම්කරණය හා වාර්තාකරණය ඇතුළුව සියලුම මූල්‍ය හා ගිණුම්කරණ කටයුතු පිළිබඳ වගකීම හා නියෝජ්‍ය මහ ලේකම් (පරිපාලන) වෙත වාර්තා කිරීම. | සැලසුම් කිරීම්, බඳවා ගැනීම්, පාරිශ්‍රමික, ප්‍රතිලාභ, ආරක්ෂාව, පුහුණුව, මානව සම්පත් කාර්ය සාධනය හා කළමනාකරණය ඇතුළුව සියළුම මානව සම්පත් කටයුතු පිළිබඳ වගකීම හා නියෝජ්‍ය මහ ලේකම් (පරිපාලන) වෙත වාර්තා කිරීම. | පරිගණක පද්ධති අවශ්‍යතා, සයිබර් ආරක්ෂාව, විද්‍යුත් තැපැල් හා වෙබ් අඩවි ඇතුළුව සියළුම තොරතුරු තාක්ෂණ කටයුතු සැලසුම් කිරීම, සංවිධානය හා කළමනාකරණය පිළිබඳ වගකීම හා නියෝජ්‍ය මහ ලේකම් (පරිපාලන) වෙත වාර්තා කිරීම. |
| සුදුසුකම් | පිළිගත් විශ්වවිද්‍යාලයක ගණකාධිකරණය පිළිබඳ ප්‍රථම උපාධිය හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධිසාමාජික (Fellow) හෝ ආශ්‍රිත (Associate) සාමාජිකයෙකු වීම අත්‍යාවශ්‍ය වේ. අදාළ ක්ෂේත්‍රයේ විද්‍යාපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම අමතර සුදුසුකමකි. මීට අමතරව අදාළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම වඩාත් සුදුසු ය. | පිළිගත් විශ්වවිද්‍යාලයක මානව සම්පත් කළමණාකරනය හෝ ඊ ආශ්‍රිත විෂයකින් ප්‍රථම උපාධිය ලබා සිටීම අත්‍යවශ්‍ය වේ. අදාල විෂය ක්ෂේත්‍රයක විද්‍යාපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම අමතර සුදුසුකමකි. මීට අමතරව අදාළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම වඩාත් සුදුසු ය. | පිළිගත් විශ්වවිද්‍යාලයක තොරතුරු තාක්ෂණය හෝ ඊ ආශ්‍රිත විෂයකින් ප්‍රථම උපාධිය ලබා තිබීම අත්‍යාවශ්‍ය වේ. අදාළ විෂය ක්ෂේත්‍රයක විද්‍යාපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම අමතර සුදුසුකමකි. මීට අමතරව අදාළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම වඩාත් සුදුසු ය. |
| පළපුරුද්ද | රජයේ, බහු පාර්ශික හෝ පෞද්ගලික අංශයේ ආයතනවල ක්‍රමක්‍රමයෙන් වගකිවයුතු තනතුරුවල අවම වශයෙන් වසර 05ක අදාළ පළපුරුද්ද. මින් වසර 03ක් අදාළ තනතුරට සමගාමී තනතුරක් විය යුතුය. | | |

| තනතුර | කළමනාකරු (සුසංවිධාන/Logistics) | කළමනාකරු (මාධ්‍ය හා බාහිර සබඳතා) | කළමනාකරු (ජා.අ.ස. ලේකම් කාර්යාලය) |
|---|---|---|---|
| විෂය පථය හා වගකීම් | රැස්වීම්, සම්මන්ත්‍රණ, ඉසව්, ප්‍රවාහන හා සැපයුම් සේවා, ගොඩනැගිලි හා පහසුකම් නඩත්තුව සහ අධීක්ෂණය ඇතුළුව සියළුම සුසංවිධාන සේවා සැලසුම් කිරීම, සංවිධානය කිරීම සහ කළමනාකරණය කිරීම පිළිබඳ වගකීම හා නියෝජ්‍ය මහ ලේකම් (පරිපාලන) වෙත වාර්තා කිරීම. | මාධ්‍ය නිවේදන, ලිපි සැකසීම, සම්මුඛ සාකච්ඡා සහ මාධ්‍ය ආයතන හා මහජනතාව සමඟ බාහිර සබඳතා ඇතුළු සියලුම මාධ්‍ය හා සන්නිවේදන කටයුතු පිළිබඳ වගකීම හා නියෝජ්‍ය මහ ලේකම් (පරිපාලන) වෙත වාර්තා කිරීම. | ජාතික ආර්ථික සභාව තුළ සියලුම අංශ, අමාත්‍ය මණ්ඩලය, රේඛීය අමාත්‍යාංශ, ආයතන හා වෙනත් බාහිර සංවිධාන සමඟ ලිපි ගණුදෙනු, සම්බන්ධීකරණය, රැස්වීම් න්‍යාය පත්‍ර, කාලසටහන් හා දෛනික මෙහෙයුම් සැලසුම් කිරීම හා පවත්වාගෙන යාම ඇතුළුව ජාතික ආර්ථික සභාවේ කටයුතු කළමනාකරණය කරමින් නියෝජ්‍ය මහ ලේකම් (ජා.අ.ස. ලේකම් කාර්යාලය) වෙත වාර්තා කිරීම. |
| සුදුසුකම් | පිළිගත් විශ්වවිද්‍යාලයක සුසංවිධානය (Logistics), මෙහෙයුම් කළමනාකරණය හෝ අදාළ විෂය ක්ෂේත්‍රයක ප්‍රථම උපාධිය ලබා තිබීම අත්‍යාවශ්‍ය වේ. අදාළ ක්ෂේත්‍රයේ විද්‍යාපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම අමතර සුදුසුකමකි. මීට අමතරව අදාළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම වඩාත් සුදුසු ය. | පිළිගත් විශ්වවිද්‍යාලයක මාධ්‍ය අධ්‍යනය, ජන සන්නිවේදනය, මාධ්‍යවේදය හෝ අදාළ විෂය ක්ෂේත්‍රයක ප්‍රථම උපාධිය ලබා තිබීම අත්‍යාවශ්‍ය වේ. අදාළ ක්ෂේත්‍රයේ විද්‍යාපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම අමතර සුදුසුකමකි. මීට අමතරව අදාළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම වඩාත් සුදුසු ය. | පිළිගත් විශ්වවිද්‍යාලයක කළමනාකරණය රාජ්‍ය පරිපාලනය, ආර්ථික විද්‍යාව හෝ අදාළ විෂය ක්ෂේත්‍රයක ප්‍රථම උපාධිය ලබා තිබීම අත්‍යාවශ්‍ය වේ. අදාළ ක්ෂේත්‍රයේ විද්‍යාපති හෝ ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම අමතර සුදුසුකමකි. මීට අමතරව අදාළ වෘත්තීය සුදුසුකම් සපුරා තිබීම වඩාත් සුදුසු ය. |
| පළපුරුද්ද | රජයේ, බහු පාර්ශික හෝ පෞද්ගලික අංශයේ ආයතනවල ක්‍රමක්‍රමයෙන් වගකිවයුතු තනතුරුවල අවම වශයෙන් වසර 05ක අදාළ පළපුරුද්ද. මින් වසර 03ක් අදාළ තනතුරට සමගාමී තනතුරක් විය යුතුය. | | |

## පොදු කොන්දේසි හා අවශ්‍යතා

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.
- සියලුම තනතුරු පූර්ණකාලීන වේ.
- ඉංග්‍රීසි හා සිංහල/ දෙමළ භාෂා පිළිබඳ විශිෂ්ට හැකියාව.
- විශිෂ්ට අන්තර් පුද්ගල හැකියා, සාමූහිකත්ව ක්‍රියා කිරීම, ජාලකරනය, සන්නිවේදන හා නායකත්ව හැකියාව සහිත ක්‍රියාශීලී හා උද්යෝගීමත් පුද්ගලයන් විය යුතුයි.
- මයික්‍රොසොෆ්ට් වර්ඩ්, එක්සෙල්, පවර්පොයින්ට් හා වෙනත් මෘදුකාංග ක්‍රියාකාරිත්වය ඇතුළුව විශිෂ්ට පරිගණක ප්‍රවීණතාව.
- කොන්ත්‍රාත් කාලසීමාව වසර 03 කි. එය නැවත දීර්ඝ කිරීම සඳහා අවකාශ ඇත.
- රාජ්‍ය අංශයේ අයදුම්කරුවන්ට ද ඉල්ලුම් කිරීම සඳහා දිරිගන්වනු ලැබේ.
- සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් හිමිකම් සහ ප්‍රවාහන, දුරකතන හා වෙනත් රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.
- සුදුසුකම් හා පළපුරුද්ද සහ වෙළෙඳපොළ සම්මතයන්ට අනුකූලව ඉහළ තරඟකාරී පාරිශ්‍රමිකයන් ගෙවනු ලැබේ.
- වහාම බඳවා ගැනීම් සිදුකෙරේ.

## ඉල්ලුම් කිරීමේ ක්‍රමවේදය

**ඉහත තනතුරු පිළිබඳව විස්තරාත්මක රැකියා තොරතුරු NEC නිල වෙබ් අඩවිය වන www.necsl.gov.lk වෙතින් බාගත කළ හැක.**

අයදුම්කරුවන් සිය අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්, පුහුණුව, සේවා පළපුරුද්ද, පර්යේෂණ හා පළකිරීම්, පරිගණක හා භාෂා ප්‍රවීණතාව සහ කුසලතා ආදිය ඇතුලත් ජීව දත්ත ලේඛනයක් (CV) සමග ආවරණ ලිපියක් (Cover Letter) ඉදිරිපත් කළ යුතු වේ. අයදුම්කරු පිළිබඳ විමසිය හැකි වෘත්තීයවේදීන් දෙදෙනෙකුගේ නම් සහ සම්බන්ධ කර ගැනීමේ තොරතුරු සහිතව අයදුම්පත් **2018 අගෝස්තු 04 වන සෙනසුරාදා** දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **මහ ලේකම් සහ ප්‍රධාන ආර්ථික විද්‍යාඥ, ජාතික ආර්ථික සභාව, ජනාධිපති කාර්යාලය, ගාලු මුවදොර, කොළඹ 01, ශ්‍රී ලංකාව** යන ලිපිනයට එවිය යුතුය.

අයදුම්පත් බහා එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය. අදාළ අවශ්‍යතා සපුරා නැති හා අඩුපාඩු සහිත හා අදාළ අවසන් දිනට පසු ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැති වීම හෝ තැපෑලේ දී ප්‍රමාදවීම පිළිබඳ පැමිණිලි සළකා බලනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන්නේ මූලිකව තෝරා ගනු ලැබූ අයදුම්කරුවන් පමණි.

සියලු බඳවා ගැනීම් පිළිබඳව අවසාන තීරණ ගැනීමේ බලය ජාතික ආර්ථික සභාව සතු වේ.

**මහ ලේකම් හා ප්‍රධාන ආර්ථික විද්‍යාඥ**
ජාතික ආර්ථික සභාව
ජනාධිපති කාර්යාලය
ගාලු මුවදොර, කොළඹ 01
ශ්‍රී ලංකාව

**දුරකතන** : + 94-11-2354469
**ඊමේල්** : nec@necsl.gov.lk
**වෙබ්** : www.necsl.gov.lk